රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුවේ නම		ශීර්ෂය
1.	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	110
2.	අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව	228
3.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	234
4.	ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව	231
5.	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	233
6.	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	230
7.	නීතිපති දෙපාර්තමේන්තුව	229
8.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	235
9.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	232
10.	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	326

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - 110
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 76.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා ම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මේ වන විට බොහෝ දුරට මෙම තත්ත්වය මඟ හරවා ගෙන ඇති අතර, 2023 වර්ෂයේ දී විගණන විමසුම් 20ක් ලැබී එයින් 15ක් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු ලබා දී ඇති අතර, ඉතිරි 05 සඳහා මාස 2ක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත. 2024 වර්ෂයේ දී විගණන විමසුම් 10ක් ලැබී ඇති අතර එයින් 01ක් හැර අනෙක් සියලුම විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ඉදිරියේ දී මෙම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	1992.08.19 දිනැති රා.ප.ව. 26/92 අනුව ගරු ඇමතිවරුන්, රජයේ වාහන පෞද්ගලික පාවිච්චිය සඳහා යොදා ගැනීමට හිමිකම් ඇති රජයේ නිලධාරීන්, 1990.01.17 දිනැති රා.ප.ව. 5/90 අනුව මනාපය පළකොට වාහන පාවිච්චි කරන නිලධාරීන් සඳහා වෙන් කර ඇති වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බැවින් අනෙකුත් වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.

වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	වාහනයක් ගර්හිත වී ඇති අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	**<u>වැඩ තහනම් කල නිලධාරීන්ගේ ණය ශේෂ</u>** **එම්.අයි.ප්‍රනාන්දු - ණය ශේෂය රු. 49,150.00** මෙම නිලධාරියා 2004 වර්ෂයේ දී වැඩ තහනමට ලක්ව 2007 වර්ෂයේ සේවයෙන් ඉවත් කර ඇත. අදාල පුද්ගලයාට ලියාපදිංචි තැපැල් මඟින් දැනුම් දී ඉන් අනතුරුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් දැනුම් දී ඇත. කෙසේ නමුත් ණය ශේෂය පියවා නොමැත. ඒ අනුව ණය අයකර ගැනීම සඳහා කෙසෙල්වත්ත පොලිසියේ පැමිණිල්ලක් දමා ඇති අතර මේ වන තෙක් පැමිණිල්ල කැඳවා නැත. එබැවින් නැවත සිහි කැඳවීම් ලිපි යොමු කර ඇතත් මේ වන තෙක් කෙසෙල්වත්ත පොලීසියෙන් ප්‍රතිචාරයක් නොමැත.ඉන් අනතුරුව ණය අයකර ගැනීම සඳහා මොරටුව පොලිස් ස්ථානය වෙතද ලිපි මඟින් දැනුම් දී නැවත සිහි කැඳවීම් ලිපි යොමු කළ ද මේ වන තෙක් ප්‍රතිචාරයක් නොමැත. **පී.වී.ගුණවර්ධන - ණය ශේෂය රු. 162,215.00** මෙම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වනවිට මෙම නිලධාරියාට විරුද්ධව කොළඹ මහාධිකරණයෙහි නඩුවක් ක්‍රියාත්මක වේ. **ජී.ඒ.සී.ගමආරච්චි - ණය ශේෂය රු. 111,832.00** මේ විට රු.27,345.00 ක මුදලක් ඇපකරුවන්ගෙන් අයකර ගෙන ඇත. ඉතිරි ශේෂය වන 84,487.00ක මුදල ඉදිරියේ දී ඇපකරුවන්ගෙන් අය වෙමින් පවතී. **ඒ.එන්.ඒ. සමරනායක රු. 110,854.68** කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ක්‍රියාත්මක වේ. 2024.05.08අමාත්‍යාංශය මඟින් නඩුවේ ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සඳහා මෝසමක් ඉදිරිපත් කර ඇත.

	ජේ.එම්.එස්.කුමාරසිරි රු.118,465.00 ගංගොඩවිල දිසා අධිකරණයේ නඩුවක් ක්‍රියාත්මක වේ. 2023.08.05 දින ඔහු පදිංචි පළාතේ ග්‍රාම නිලධාරි මඟින් සිතාසි භාර දීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. **සේවය හැරගිය නිලධාරින්ගේ ණය ශේෂ** **එච්.එස්.සී.පුෂ්පකුමාර - ණය ශේෂය රු. 121,392.00** මෙම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර පූර්ව නීති සාකච්ජාවක් 2023.11.16 දින නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්වා ඇත. **එච්.ඒ.ඒ.චාමර - ණය ශේෂය රු. 117,003.00** මෙම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. **එන්.ජී.ජේ.සී.නාරංගස්පිටිය රු. 4,990.00** 2015.06.29 සිට සේවය අතහැර ගොස් සිටින මෙම නිලධාරියාගේ ණය ශේෂය 2022.04.30 දිනට ඇපකරුගෙන් අයකර අවසන් වී ඇත. **ටී.එම්.යු.බී.තෙන්නකෝන් රු.235,590.00** මෙම නිලධාරියාට ලියාපදිංචි තැපැල් මඟින් හිඟ මුදල් ගෙවීම් කරන ලෙස සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. ණය ශේෂය පියවා නොමැති බැවින් මෙම නිලධාරියාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. **මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ** **එම්.එස්.ඩබ්.මාරසිංහ 181,300.00** අදාල නිලධාරියාගේ සේවය ස්ථීර කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලැබී ඇත. යැපෙන්නන්ගේ වාර්තාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ලැබී නොමැති හෙයින් මරණ පාරිතෝෂිකය සකස් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නොහැකි වී ඇත.

	ආර්.එම්.වී.විශ්වජිත් 189,177.00 අදාල නිලධාරියාගේ මරණ පාරිතෝෂිකය සඳහා අවශ්‍ය ලිපි සැකසෙමින් පවතින අතර මරණ පාරිතෝෂිකය ගෙවීම සඳහා යැපෙන්නන්ගේ වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගෙන් සහතික කර ගැනීමට යොමු කර ඇති හෙයින් මරණ පාරිතෝෂිකය සකස් කිරීමට නොහැකි වී ඇත. **ඒ.එස්. තිලකසිරි 82,769.00** අදාල නිලධාරියාගේ ණය ශේෂ 2024 අප්‍රේල් මස මරණ පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත. **<u>විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ</u>** **එන්.පී. ගාල්ලගේ 350,979.00** අදාල නිලධාරියාගේ ණය ශේෂ 2023 දෙසැම්බර් මස විශ්‍රාම පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත. **ජේ.ඒ.ඩී.ඩබ්. කුමාර 125,736.00** අදාල නිලධාරියාගේ ණය ශේෂ 2023 අප්‍රේල් මස විශ්‍රාම පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත. **ඩී.සුවිනීතා 68,080.00** අදාල නිලධාරියාගේ ණය ශේෂ 2023 අප්‍රේල් මස විශ්‍රාම පාරිතෝෂිකයෙන් නිරවුල් කර ඇත.
මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රීම අත්තිකාරම් ලබා දීමේ දී නියමිත දිනට අතුරු අග්‍රීම නිරවුල් කරන බවට ආකෘති පත්‍රයක් මඟින් අදාළ මාණ්ඩලික නිලධාරියාගේ අත්සන ලබා ගනිමින් නිකුත් කරනු ලබන අතර මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
රැස්කළ ආදායම් අදාළ විධිවිධානවලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි.	මාසිකව රැස් කරනු ලබන ආදායම් අදාළ විධි විධාන පරිදි නියමිත ආදායම් ශීර්ෂවලට ගිණුම්ගත කිරීම සිදු කරනු ලැබේ.

වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2022 වර්ෂයේ රජයේ විගණකගේ වාර්තාව ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් කාර්ය සාධන වාර්තා සකස් කිරීම නිසි පරිදි ආරම්භ කර කටයුතු කර තිබුණ ද නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඒ අනුව 2022 කාර්ය සාධන වාර්තාව2023.06.28 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

දෙවැනි කොටස : 76.00	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතී.
ආයතනයේ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	එය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතින අතර ඉදිරියේ දී එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම හේතුවෙන් සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ 01/2023 ප්‍රකාරව අත්‍යවශ්‍ය පුහුණු අවස්ථාවන් සඳහා පමණක් ලබාදීම හේතුවෙන් පුහුණු අවස්ථාවන් ප්‍රමාණය අඩු වී ඇත.
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ 2022 මුදල් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව - 228
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්
පළමු කොටස : 83.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මේ වන විට බොහෝ දුරට මෙම තත්ත්වය මඟ හරවා ගෙන ඇති අතර, විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ඉදිරියේ දී මෙම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අමාත්‍යාංශය මඟින් විනිසුරුවන් වෙත පමණක් වාහන අනුයුක්ත කර ඇති අතර 1992.08.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/92 අනුව විනිසුරුවන් වෙත අනුයුත්ක කර ඇති රජයේ වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා නිර්දේශ ලබා ගැනීමට අධිකරණ කලාප අනුව කමිටු පත් කර ඇති අතර එම කමිටුවල නිර්දේශ මත ණය අය කර ගැනීම/ කපා හැරීම සිදු කරනු ලැබේ. එයට අමතරව ණය ශේෂ වර්ගීකරණයන් අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග පහතින් දක්වා ඇත. **01.අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිළධාරීන්** අදාළ ණය ශේෂය අය කර ගැනීම සඳහා රා.මු.ව. 01/2024 අනුව ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අනුමැතිය මත කපා හැරීමට ලේඛණ ඉදිරිපත් කර ඇත. **02. පළාත් සභා වෙත මුදාහළ නිළධාරීන්**

	2022.12.31 දින වන විට රු. 193,550.00ක හිඟ ණය ශේෂයක් පැවති අතර, එම ණය ශේෂය 2024 මැයි මස වන විට ගෙවා අවසන් කර ඇත. **03.මියගිය නිළධාරීන්** 2022.12.31 දින වන විට රු.4,748,929.98ක හිඟ ණය ශේෂයක් පැවති අතර, 2024.06.30 වන විට රු.1,676,916.65ක ණය ශේෂයක් පියවා අවසන් කර ඇත. ඉතිරි රු.3,072,013.33ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා පහත පරිදි කටයුතු කර ඇත. • විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය මඟින් ණය ශේෂය අය කරගැනීම සඳහා අවශ්‍ය ලිපිගොණු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. • මරණ පාරිතෝෂිකය අහිමි කර ඇති නිලධාරින්ගේ සහ පෞද්ගලික ලිපිගොණුව සොයාගැනීමට නොහැකි වී ඇති නිලධාරින්ගේ හිඟ ණය ශේෂය අයකර ගැනීම සඳහා ගත හැකි සියළු ක්‍රියාමාර්ග ගෙන ඇති නමුත් ණය ශේෂ අයකරගත නොහැකිවී ඇත. එබැවින් ණය මුදල ණය ලේඛණයෙන් කපා හැරීමට අදාළ අධිකරණ කලාපයේ හිඟ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා පත් කර ඇති කමිටුව නිර්දේශ කර ඇත. රා.මු.ව. 01/2024 අනුව ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේඅනුමැතිය මත කපා හැරීමට ලේඛණ ඉදිරිපත් කර ඇත. • ඇපකරු පිළිබඳ තොරතුරු ලබා ගෙන එමඟින් ණය ශේෂය අයකරගැනීමට කටයුතුකරන ලෙස අධිකරණය වෙත දැනුම් දී ඇත. **04. විශ්‍රාම ගිය නිළධාරීන්** 2022.12.31 දින වන විට රු.7,404,657.36 ක හිඟ ණය ශේෂයක් පැවති අතර, 2024.06.30 වන විට රු.5,303.503.86කණය ශේෂය පියවා අවසන් කර ඇති අතර ඉතිරි රු.2,101,153.50ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා, පහත පරිදි කටයුතු කර ඇත. • විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය මඟින් ණය ශේෂය අය කරගැනීම සඳහා අවශ්‍ය ලිපිගොණු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. • ණය ශේෂය ගෙවන ලෙස ණයකරුවන් වෙත දන්වා ලිපි නිකුත් කර ඇති අතර විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම පිළිබඳ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

	• එකතුව රු.281,757.00ක ණය ශේෂවලට අදාළ හිඟ මුදල වාරික වශයෙන් ගෙවීම් කරනු ලබයි. • විනය පරීක්ෂණ පවතින නිලධාරීන් සඳහා වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් ලබා ගන්නා ලෙස අධිකරණ දැනුවත් කර ඇත. **05.සේවයෙන් පහකළ/වැඩ තහනම් නිළධාරීන්** 2022.12.31 දින වන විට රු.10,225,759.28ක හිඟ ණය ශේෂයක් පැවති අතර, 2024.06.30 වන විට රු. 2,485,600.07ක ණය ශේෂය පියවා අවසන් කර ඇති අතර ඉතිරි රු.7,740,159.21ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා, පහත පරිදි කටයුතු කර ඇත. • රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අනුමැතිය මත ණය ශේෂය කපා හැරීමට ලේඛණ ඉදිරිපත් කර ඇත. • එකතුව රු.1,032,891,.24ක ණය ශේෂ මාසික වාරික වශයෙන් ගෙවීම් කරනු ලැබේ. • එකතුව රු.316,939.00ක හිඟ ණය ශේෂ මාසික වාරික වශයෙන් ඇපකරුවන් අයකර ගැනීම සිදු වේ. • එකතුව රු.1,215,168.00ක ණය ශේෂ ඇපකරුවන් මඟින් අය කර ගැනීමට නිර්දේශ කර ඇත. • ඇතැම් ණය ශේෂ අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇත. **06. සේවය හැරගිය නිළධාරීන්** 2022.12.31 දින වන විට රු.6,612,852.54ක හිඟ ණය ශේෂයක් පැවති අතර, 2024.06.30 වන විට රු.1,556,409.16ක ණය ශේෂය පියවා අවසන් කර ඇති අතර ඉතිරි රු.5,056,443.38ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා, පහත පරිදි කටයුතු කර ඇත. • රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ අනුමැතිය මත ණය ශේෂය කපා හැරීමට ලේඛණ ඉදිරිපත් කර ඇත.

	• එකතුව රු.1,178,731.63ක හිඟ ණය ශේෂ මාසික වාරික වශයෙන් ගෙවීම් කරනු ලැබේ. • ඇපකරු මඟින් ණය මුදල අයකර ගැනීමට නිර්දේශ කර ඇත. • ඇතැම් ණය ශේෂ අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් ලෙස පවතිනුයේ ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල් හා නඩු කටයුතුවලට අදාල ඇප තැන්පත් වේ. වසර 02කට වඩා අධික කාලයක් ක්‍රියාත්මක වන ඉදිකිරීම්වලට අදාල රැඳවුම් මුදල් අදාල ඉදිකිරීම අවසන් වන තෙක් රඳවා තබා ගත යුතු බැවින් එම තැන්පතු වසර 02 ඉක්මවුවද තැන්පත් ගිණුමේ රඳවා තබා ගත යුතුව ඇත. එමෙන්ම විදේශ සිතාසි වෙනුවෙන් වන තැන්පත් ශේෂ සඳහා අධිකරණ නියෝගයක් ලැබෙන තෙක් රඳවා තබා ගතයුතු වේ. එසේම අධිකරණයන්හි පවතින වසර 02ට වඩා කල් ඉකුත් වූ තැන්පතු නඩු කටයුතුවලට අදාළ ඇප තැන්පත් වන බැවින් නඩු කටයුතු අවසන් වන තෙක් රඳවා තබා ගත යුතු වේ.
මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇත්ලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති අතර, ඒ අනුව කටයුතු සිදුකරමින් පවති.

දෙවැනි කොටස : 66.00

2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	පුරවැසි / සේවා ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීම, එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම, මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම, මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කිරීම ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව වන අතර ඒ සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක්	

සකස් කර නොතිබුණි.	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	ආයතනයේ 2022 මුදල් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් වාර්තා වී නොමැත.

ආයතනයේ නම හා ශීර්ෂය : ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව - 234

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 97.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු අතර දෙපාර්තමේන්තුවට අදාළ අවදානම් හඳුනාගෙන අමාත්‍යාංශයේ අවදානම් ලේඛණයට ඇතුළත් කර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සියලු ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.

දෙවැනි කොටස : 93.00	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයේ පුහුණු අවස්ථා බොහොමයක් කොවිඩ් වසංගත තත්ත්වය මත නොපැවැත්වූ අතර මේ වන විට සියලු නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා සලසා දී ඇත.
ආයතනයේ නම හා ශීර්ෂය : ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව - 231	
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79	

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 89.00	
2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම්	මේ වන විට සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කර

දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පවත්වාගෙන යනු ලැබේ.
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු අතර දෙපාර්තමේන්තුවට අදාළ අවදානම් හඳුනාගෙන අමාත්‍යාංශයේ අවදානම් ලේඛණයට ඇතුළත් කර ඇත.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022.01.10 දින වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව කාර්තුමය වශයෙන් ප්‍රගතිය වාර්තා කර ඇත.
මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ඉටු කරනු ලබයි.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	2023.03.10 දින මුදල් රෙගුලාසිප්‍රකාරවරජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු අවසන් කර ඇත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	231 වැය ශීර්ෂයෙන් වෙනත් ආයතන වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම හෝ වෙන් කිරීම සිදු නොකරයි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේඅධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1279(II)-T හා 2023.12.21 දිනැති ලිපියෙන් එම තනතුරු අනුමත කර ඇත.

දෙවැනි කොටස : 87.00	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය මඟින් පුහුණු පාඨමාලා සඳහා ප්‍රතිපාදන වෙන් කළ ද එම වර්ෂයේ රට තුළ පැවති අයහපත් තත්ත්වය හමුවේ සැලසුම් කළ පුහුණු අවස්ථා පැවැත්වීමට නොහැකි විය. එනමුත්, 2023 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගෙන් 90%ක් ඉක්මවා පුහුණු අවස්ථා සලසා දී ඇත.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/	2022 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කළ මතයකි.

ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	

ආයතනයේ නම හා ශීර්ෂය : ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - 233
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 68.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2022 වර්ෂයේ දී අවදානම් ලේඛණය ඇතුලත් කිරීම සඳහා කරුණු හඳුනාගෙන නොතිබුණි. කමුත් මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු 2023 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු අතර මේ වන විට දෙපාර්තමේන්තුවට අදාළ අවදානම් හඳුනාගෙන අමාත්‍යාංශයේ අවදානම් ලේඛණයට ඇතුළත් කර ඇත.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මපිළියෙල කළ නමුත් රට තුල පැවති වාතාවරණය මත නියමිත දින වකවානුව තුළ අදාල වාර්තා සඳහා අනුමැතිය ලබා ගත නොහැකි විය. නමුත් 2024 වර්ෂයේ නියමිත දින වකවානු ඇතුළත අනුමැතිය ලබා ගෙන අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත.
වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා මසක කාල සීමාවක් තුළ ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර 2024 වර්ෂයේ සිට ඉදිරිපත් වූ සෑම විගණන විමසුමක් සඳහාම මසක කාලයක් තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	
මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත වැඩ බලන පදනමින් අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරිනියක් 2021.11.19 දින පත් කර තිබුණි. 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර

මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	විගණන වැඩසටහනක් සාදා තිබුණ ද 2022 වර්ෂය තුළ නිලධාරීන් රාජකාරී සඳහා පැමිණීම සතියකට දින දෙකකට සීමා වූ බැවින් විගණනකටයුතු නිසි පරිදි ඉටු කළ නොහැකි විය. කෙසේ වුව ද එම නිලධාරිනියගේ වැඩ බැලීමේ පත්වීම ද වර්ෂයක කාලයකට පමණක් සීමා විය. කෙසේ වෙතත් 2023 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ඉටු කරනු ලබයි.
2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වරින් වර ඉල්ලුම් කරන ලද වාර්තා පමණක් ලබා දුන් අතර 2023 වර්ෂයේ සිට අංක 01/2017 දරණ වත්කම් චක්‍රලේඛය මඟින් ඉල්ලුම් කරන ලද කාර්තුමය තොරතුරු ලබා දීම ආරම්භ කරන ලදී.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ ඌනතා අතිරික්තතා පිළිබඳව නිර්දේශ ලබා දී නොතිබුණි.
සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	දෙපාර්තමේන්තුවේ දැනට භාවිතා කරනු ලබන වාහනවලින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇති තවමත් කල්බදු වාරික ගෙවන වාහනය හැර අනෙකුත් සියලුම වාහන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇති අතර ඒවායෙහි අයිතිය තහවුරු කිරීමේ ලේඛන දෙපාර්තමේන්තුව සතුව පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සංචිත වාහන වෙනුවෙන් මාසිකව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබයි.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට සෑම වාහනයක් සඳහා ම ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	සියළුම වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104-109 අනුව ලබා දී ඇති ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව පෙන්වා දෙමි.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර	බැංකු සැසඳුම්වලින් අනාවරණය වන සියළුම ගැලපුම් ඊට පසු මාසයේ දී ගලපනු ලබයි. කෙසේ වුවද තොරතුරු ප්‍රමාණවත් නොවන සෘජු තැන්පතු නිරවුල් කරනු ලබන්නේ අදාල ලැබීම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමෙන්

නොතිබුණි.	පසුවය.
මු.රෙ.94(1)ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මු.රෙ.94(1) අනුව ලබා දී ඇති ප්‍රතිපාදන අනුව වැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹෙන ලද්දේ මු.රෙ.94(2) අනුව සලසා ඇති ප්‍රතිපාදන සීමාව තුල බව පෙන්වා දෙමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022 වර්ෂය වන විට වර්ෂයකට වඩා වැඩි කාල සීමාවක් තුළ සිට පැවත එන රු. 86,103.00 ක වටිනාකමකින් යුතු ණය ශේෂ 4ක් පැවති අතර එම වටිනාකමින් රු. 64,949.00 ක් වටිනා ශේෂ 2 ක් මේ වන විට අයකර ගෙන ඇත. ඉතිරි ණය ශේෂ පියවීමට කටයුතු කරන මෙන් අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත දැනුම් දී ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	2022 වර්ෂය තුළ රට තුළ පැවති භාණ්ඩ හිඟතාවය හා ඉන්ධන ගැටළුව මත නිලධාරීන් සේවා මුර ක්‍රමයට සේවයට පැමිණීම මත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රීම පියවීමේ ප්‍රමාදයක් සිදු වුව ද 2024 වර්ෂයේ දී සෑම තත්කාර්ය අතුරු අග්‍රීමයක්ම නියමිත කාල සීමාව තුළ නිරවුල් කර ඇත.
වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධන වාර්තාව රට තුල පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් නියමිත කාලවකවානුව තුළ ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය.

දෙවැනි කොටස : 63.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2022 වර්ෂය වන විට වෙබ් අඩවිය අක්‍රීය වී තිබුණි. එය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි බැවින් 2024 වර්ෂයේ දී නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදනය ආරම්භ කර මිල ගණන් කැඳවා ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	නව වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ දී පැමිණිලි හා ප්‍රශංසා ආදිය සටහන් කිරීමට ද ඉඩකඩක් වෙන් කර ඇත.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍ර ලේඛයෙන්	2023 වර්ෂ අවසානයේ දී පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කරන ලදී.

සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	
ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු පත් කර ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂය අවසානයේ දී ඉදිරි වර්ෂ දෙක වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට දේශීය හා විදේශීය පුහුණු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා කිරීම මත පුහුණු අවස්ථා ප්‍රදානය නතර කර තිබූ බැවින් කාර්ය මණ්ඩලයෙන් 50%කට පිරිසකට අවම වශයෙන් පැය 12කට නොඅඩු අවස්ථා සැලසීම සිදු කළ නොහැකි විය. නමුත් 2023, 2024 වර්ෂවල විදේශ ආධාර යටතේ සහ මුදල් අයකර නොගන්නා පාඨමාලාවන්ට නිලධාරීන් යොමු කිරීම මඟින් නිලධාරීන් හට අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ප්‍රතිශතයකින් පුහුණු අවස්ථා සැලසීමට කටයුතු කරන ලදී. 2024 වර්ෂය වන විට සමස්ත කාර්ය මණ්ඩලය සමඟ කාර්ය සාධන ගිවිසුම් සඳහා ගිවිසුම්ගතව ඇත.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	
සැලසුමගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ විගණන මතය තත්වාගනණය කළ මතයකි.

ආයතනයේ නම හා ශීර්ෂය : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව - 230

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 76.00	
අභ්‍යන්තර විගණන විමසුම්ලේඛණය යවත්කාලීනව පවත්වා නොතිබුණි.	විගණන විමසුම් ලේඛණයක් නඩත්තු කර එහි රජයේ විගණකාධිපති විගණන විමසුම් හා අභ්‍යන්තර විගණන විමසුම් වෙන වෙනම සටහන් කර යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අනුමත කර නොමැති අතර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන්වලට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයන් ද ඇතුළත් කර අභ්‍යන්තර විගනණය සිදු කරනු ලබයි.ඒ අනුව දෙපාර්තමේන්තුවට අදාළ අවදානම් හඳුනාගෙන අමාත්‍යාංශයේ අවදානම් ලේඛණයට ඇතුළත් කර ඇත.
මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක යටතේ අනුමත අභ්‍යන්තර විගණන වැඩසටහනට මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන විෂය ක්ෂේත්‍රය ඇතුළත් කර ඇත.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	අමාත්‍යාංශය මඟින් කාර්තු වශයෙන් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවේ දී මෙම දෙපාර්තමේන්තුව සඳහා වෙනම ම කාලපරිච්ඡේදයක් වෙන් කර සාකච්ඡාවට භාජනය විය යුතු කරුණු සමාලෝචනය කර අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් සිදු කරනු ලබයි. 2024 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස පසුගිය විගණන හා කළමනාකරණ කමිටුවේ දී ලබා දුන් උපදෙස් පරිදි, 2024.07.24 දින පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා 2022 වර්ෂයට අදාළව සෑම මසකම විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිලධාරීන් හට අනුයුක්ත කර ඇති වාහන විටින් විට අළුත්වැඩියාවන්

	සඳහා යොමු කරන අවස්ථාවන්වල දී සංචිත වාහන තාවකාලිකව පවරා දී ඇති විට හැර සංචිත වාහනවල ධාවන සටහන් යාවත්කාලීන කර විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	26/29 රා.ප.ව.ලේ අනුව නිලවාහන ලෙස නිලධාරීන්ට අනුයුක්ත කර ඇති වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම අවශ්‍ය නොවේ. ඒ අනුව සංචිත වාහනයක් වන NA 6018 රථය සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සෑම වාහනයකම ලොග් සටහන් පොත් මේ වන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව යටතේ අක්‍රීය බැංකු ගිණුම් නොමැත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	අදාල මුල්‍ය වර්ෂය තුළ පමණක් වෙනත් දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.
	දෙවැනි කොටස : 88.00
ඉල්ලා සිටින තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණ පවත්වා නොතිබුණි.	පැමිණිලි ලේඛණගත කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් ගොනුවක් පවත්වාගෙන යනු ලබන අතර එම තොරතුරු සාරාංශගත කර සටහන් කරනු ලබන ලේඛණයක් ද පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ වන විට සඳහා දෙපාර්තමේන්තුවේ පුහුණු සැලැස්මක් සකස් කර ඒ අනුව නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබා දීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ විගණන මතය තත්වාගනණය කළ මතයකි.

ආයතනයේ නම හා ශීර්ෂය : නීතිපති දෙපාර්තමේන්තුව -229

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 76.00	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	කළමනාකරණ සේවා නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 54 ක් පවතින අතර ඒ පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර තිබුණද මේ දක්වා එම පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් ඒ ඒ විෂයයන් සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති තත්ත්වය මත විගණන විමසුම්වලට පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාදවී ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ රට තුළ පැවතිආර්ථික අවපාතය හේතුවෙන්ඇති වූ ඉන්ධන අර්බුදය මත කාර්යාල වරින් වර වසා තැබීම නිසා භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලය තුළ සිදු කළ නොහැකි වූ අතර භාණ්ඩ සමීක්ෂණයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද ප්‍රමාද වීම මත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය.ඉදිරි වර්ෂයන්හිදී මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අවසන් කර වාර්තාව නියමිත කාල වකවානු තුළ ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශයන් ද අනෙකුත් නිර්දේශයන් ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	අදාල අක්‍රිය බැංකු ගිණුම නිරවුල් කර ඇති අතර තවදුරටත් අක්‍රිය බැංකු ගිණුම් නොමැත.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් අදාළ නිළධාරීන්ට ලබා දෙන ලද අතර ඒ අනුව කටයුතු කෙරෙමින් පවතී.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	2022 වර්ෂය සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුණද,ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීමත්, භාණ්ඩ මිල ගණන් විශාල වශයෙන් ඉහළ යාමත් සිදුවූ අතර අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමසඳහා අවශ්‍ය සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් බැරකම්වලට එළඹීමට සිදු විය.ඉදිරියේදීප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමටත්, පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022 වර්ෂය ආරම්භයේදී අයවිය යුතුව තිබූ හිඟ ණය ශේෂය වූ රු.1,807,717 න් 2022,2023 හා 2024 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.282,320 ක්, රු.747,315 ක් හා රු.98,790 ක් වශයෙන් රු. 1,128,425 ක හිඟ ණය අය කර ගැනීමට කටයුතු කර ඇත. අනෙකුත් ණය ශේෂයන් සම්බන්ධයෙන්ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST/6/04/LOL/1030 ලිපිය හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ SA/SDA/1/1/21 ලිපිය අනුව අවශ්‍ය නෛතික කටයුතු සිදු කෙරෙමින් පවතී.
මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි. මු.රෙ 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබුණි.	නිලධාරීන් ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිමවී දින 07 ක් ඇතුළත නිරවුල් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඒඅනුව අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. ඉදිරියේ දී මු.රෙ. 371 හි වන සීමාව අනුව පමණක් තත්කාර්ය අතුරු අග්‍රීම ලබා දීම සිදු කරනු ලබන බවද දන්වමි.
රැස්කර තිබුණු ආදායම්, සෘජුව ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	රැස් කරනු ලබන ආදායම් නොපමාව ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලබන අතර 2022 වර්ෂයේදී වරින් වර කාර්යාල වසා තැබීම නිසා වෙක්පත් කිහිපයක් දින කිහිපයක් පමණක් ප්‍රමාද වී ඇත. උපරිම දින 14 ක කාලයක් ඇතුළත එනම් මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත රැස් කළ සියළු ආදායම්, ආදායම් ගිණුමට බැර කර ඇති බව දන්වමි.මේ වන විට ගිණුම් අංශයට ලැබෙන සියළු ආදායම් එදිනම ආදායම් ගිණුමට බැර කරනු ඇත.

දෙවැනි කොටස : 40.00

ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින්	ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි

මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීම පිළිබඳව අධ්‍යයනය කෙරෙමින් පවතින බව දන්වමි.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	තිරසර සංවර්ධන සභාව මඟින් නිශ්චය කර ඇති ආකාරයට, නීතිපති දෙපාර්තමේන්තුව සඳහා 16 වැනි තිරසර සංවර්ධන අරමුණ වනසාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන යන තිරසර අරමුණ හඳුනාගෙන ඇත.එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා,"සියළුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යප්‍රවර්ධනය කිරීම".යන ඉලක්කය නිශ්චය කර ඇත. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය දර්ශක සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
හඳුනාගත් තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.	මෙවන විට පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කරක්‍රියාත්මක වෙමින් පවතින අතර එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරනුලැබේ.
ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධාන අනුව 2023වර්ෂයේ සිටනීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයසඳහා වූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කාර්යමණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සහතික වන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලැබේ.

සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කෙරෙමින් පවතී.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට හා ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂඨ නිලධාරියෙකු නම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.
සැලසුම් සහගත පුහුනු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	මේවන විට සැලසුම් කල පුහුණු අවස්ථා සියල්ල ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කළ මතයකි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

ආයතනයේ නම හා ශීර්ෂය : නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව - 235
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 94.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ විගණන අංශය මඟින් සකස් කර පවත්වාගෙන යනු ලබන අවදානම් ලේඛණය අනුව අභ්‍යන්තර විගණන කටයුතු

	සිදු කෙරෙනු ලැබේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකසා ඉදිරිපත් කොට ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්ත්මේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමග කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක් මුදල් සැසඳුම් ප්‍රකාශය සකස් කොට නොතිබූ අතර මින් ඉදිරියේදී එම ප්‍රකාශය සකස් කොට නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන බව දන්වමි.

දෙවැනි කොටස : 64.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවිය තාක්ෂණික දෝෂයක් නිසා සක්‍රීයව නොතිබූ අතර එම තත්ත්වය යථාවත් කිරීමට (revamping)2022 හා 2023 වසරේ අයවැයෙන්ප්‍රතිපාදනඉල්ලුම් කළදේ සඳහා ප්‍රතිපාදන හිමි වූයේ 2024 වසරේ අනුමත අයවැයෙනි.ඒ අනුව මේ වන විට දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවිය මහජනයා වෙත අදහස් දැක්වීමේ හැකියාවද ලබා දෙමින් සක්‍රීය කොට ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වසරේ පැවති වියදම් සීමා කිරීමේ චක්‍රලේඛයට අනුගතව පුහුණු අවස්ථා සඳහා ප්‍රතිපාදන අවම වීම මත පුහුණු අවස්ථා ලබා දීමට නොහැකි වූ අතර මේ වන විට ලැබී ඇති ප්‍රතිපාදන වලට අනුකූලව අවශ්‍යතාවය මත පුහුණුවීම් සිදු කරනු ලබයි.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳව තත්ත්වාගණන කළ මතයක් ප්‍රකාශ කර ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : බන්ධනාගාර දෙපාර්තමේන්තුව - 232
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 78.00	
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලබයි.
2004.5.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මේ වන විට අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කර ගෙන යනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	බන්ධනාගාර ආයතන සම්බන්ධයෙන් ඉදිරිපත් වන විගණන විමසුම් සඳහා අදාල ආයතන වලින් තොරතුරු ගෙන්වා ගෙන පිළිතුරු සකස් කිරීමේ දී ලබා දෙන කාලය ප්‍රමාණවත් නොවන හෙයින් අදාල කාල සීමාව තුළ අතුරු පිළිතුරක් ලබා දීමට කටයුතු කරන අතර හැකි සෑම අවස්ථාවකදීම ලබා දී ඇති කාලය තුළ පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	රට තුළ පැවති ආර්ථික අර්බුදය හා කාර්ය මණ්ඩල සීමා කිරීම නිසා අපේක්ෂිත පරිදි රැස්වීම පැවැත්වීමට නොහැකි වූ අතර රැස්වීම් වාර තුනක් පමණක් පවත්වන ලදී. නමුත් 2023 වර්ෂයේ දී රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.
සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැති වීම.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය කර ඇති සියලුම වාහනවල හා අධිකරණ අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති වාහන අතුරින් කිහිපයක ද අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ ඇති අතර අනෙක් වාහනවල අයිතිය එම වාහන ලබා දීමේ දී ලේඛණවල අඩුපාඩු පැවතීමහේතුවෙන් පවරා ගැනීම් කටයුතු ප්‍රමාද වී ඇත. එම වාහනවල අයිතිය ද පවරා ගැනීමට අවශ්‍ය ලේඛණ අමාත්‍යාංශය වෙතින් ලබා ගෙන

	ඉදිරි කටයුතු සිදු කරමින් පවති.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියලුම බන්ධනාගාර ආයතන භාවිත කරන වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සඳහා වන උපදෙස් ලබා දී ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ඇති වාහන අතුරින් අපහරණය කළ යුතු වාහන සියල්ලම මේ වන විට අපහරනය කර ඇති අතර අයිතිය පවරා ගැනීමට නොහැකිව ඇති වාහන එම හේතුව නිසාවෙන් අපහරණය ප්‍රමාද වී ඇති නමුත් වාහනවල අයිතිය පවරාගත් වහාම අදාල කටයුතු සිදු කරනු ලැබේ.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මේ වන විට මුදල් රෙගුලාසි.110 ප්‍රකාරව අදාල ආකෘතිය යටතේ නිවැරදි හානි පාඩු ලේඛණයක් ආරම්භ කර නිසි ලෙස ලේඛණය යාවත්කාලී කරමින් මුදල් රෙගුලාසිප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් සම්බන්ධව මේ වන විට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ලබා දුන් උපදෙස් පරිදි අමාත්‍යාංශ නියෝජනයක් සහිතව කාර්මික අත්තිකාරම් ගිණුමේ පවතින හිඟ ණය අය කර ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලදී.එහි දී කපා හැරීමට සුදුසු බවට හඳුනාගත් රු.5,000.00ට අඩු අවුරුදු 15කට වඩා වැඩි කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වූ බිල්පත්, බන්ධනාගාරයේ ඇතිවූ කැරලි, ගිණිගැනීම් හා ගංවතුර වැනි ආපදා හේතුවෙන් විනාශ වී ඇති බිල්පත් හා බිල්පතේ සහතික කළ පිටපත පමණක් සොයා ගැනීමට හැකි වූ බිල්පත් ලෙස, රු.මිලියන 3.47 ක වටිනාකමකින් යුත් ණය ශේෂ කපා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා අමාත්‍යාංශ නියෝජනයක් සහිතව කමිටුවක් පත් කර ඇති අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව දිගු කලක් තිස්සේ අය නොවී පවතින විශ්‍රාම හා මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අතරින් තොරතුරු නොමැති රු.100,000.00 ට අඩු රු.274,044.00ක ණය ශේෂ කපා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරමින් පවති.
මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	මෙම කටයුතු නිවැරදි කර ගැනීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
2017 .09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	ප්‍රමාදවීම් වලින් තොරව නියමිත දිනට යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල කාර්තු වාර්තා කාර්තුව අවසන් වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිමට කටයුතු කරනු ලැබේ.

දෙවැනි කොටස : 76.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	පවත්නා ආකෘති භාවිතා කරමින් අදාළ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
සැලසුම් සහගත පුහුනු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	මෙම තත්ත්වය මහහරවාගෙන 2023 වර්ෂය වන විට ප්‍රගතිය 100%ක් අත්කරගෙන ඇත.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයට අදාලව මුල්‍යප්‍රකාශන පිළිබඳව තත්ත්වාණනය කළ මතයක් ලබා දී ඇත.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	එවැනි අඩුපාඩුවක් සිදු වී නොමැත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි	2022 සහ 2023 වර්ෂ සඳහා පිළිවෙලින් ස්ථාන මාරු මණ්ඩලය මඟින් නිලධාරින් 503ක්

ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	සහ 669 දෙනෙකු ස්ථාන මාරු කර ඇත.බන්ධනාලගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිඟතාවයක් පවතින අතර, ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමේ දී පවතින නිලධාරී හිඟතාවය මත එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වේ.

ආයතනයේ නම හා ශීර්ෂය : ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව - 326
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා /දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වයන්**
පළමු කොටස : 65.00	
2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2022 වර්ෂය වන විට සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබීය.
අභ්‍යන්තර විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වන විට හානි පිළිබඳ ලේඛණයක් පවත්වා ගෙන යන අතර, එය යාවත්කාලීන කර ඇත.
අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කර පවත්වාගෙන යනු ලබන අවදානම් ලේඛණය අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කෙරෙනු ලැබේ.
වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඒ සඳහා එවකට මෙම දෙපාර්තමේන්තුව අයත්ව තිබූ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය

	අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන තිබුණි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහා ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති දින සිට උපරිම දින 05-10ක් ඇතුලත පිළිතුරු ලබා දී ඇත.
මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන්වලට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයන් ද ඇතුළත් කර අභ්‍යන්තර විගනණය සිදු කරනු ලබයි.
2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ රට තුළ පැවතිආර්ථික අවපාතය හේතුවෙන්ඇති වූ ඉන්ධන අර්බුදය මත කාර්යාල වරින් වර වසා තැබීම නිසා භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලය තුළ සිදු කළ නොහැකි වූ අතර භාණ්ඩ සමීක්ෂණයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද ප්‍රමාද වීම මත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය.ඉදිරි වර්ෂයන්හිදී මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අවසන් කර වාර්තාව නියමිත කාල වකවානු තුළ ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශයන් ද අනෙකුත් නිර්දේශයන් ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2022 වර්ෂය වන විටත් එක් සංචිත වාහනයක රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. මේ වන විට අනෙක් සංචිත වාහන 02 හි රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 04 සඳහා ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.

බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මෙවන විට සියළුම නිරවුල් කිරීමේ කටයුතු සිදුකර අවසන් කර ඇත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	ඉදිරියේ දී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා ලෙස අදාළ ආයතනයට උපදෙස් ලබා දෙන ලදී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙවන විට අයවිය යුතු හිඟ ණය ශේෂයන් අයකර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මේ වන විට මු.රෙ.571 ප්‍රකාරව කටයුතු සිදුකර අවසන් කර ඇත.
මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති අතර, ඒ අනුව කටයුතු සිදුකරමින් පවති.
වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2022 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ලැබී ඇත්තේ 2023.06.19 දින වේ. ඒවන විට කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත සකස් කර තිබූ අතර, විගණන වාර්තාව ලැබීමෙන් අනතුරුව කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ලබාදීමට කටයුතු කර ඇත.

දෙවැනි කොටස : 41.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2023 වර්ෂයේ සකස් කර ඇත .
2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර,	2023 වර්ෂයේ අගභාගය වන විට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය අවසන් කර ඇත.එය ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට ද කටයුතු කර ඇත.

ක්‍රියාත්මක කර නොතිබුණි	
ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී මඟින්ද්වි මාසික ප්‍රගති සමාලෝචන හරහා ප්‍රජා විශෝධන නිලධාරීන් හාසංවර්ධන නිලධාරීන් අධීක්ෂණය කරනු ලබයි. අර්ධ වාර්ෂික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන ආයතන ප්‍රධානියා හා පත්කරනු ලැබූ කමිටුවක් මඟින් සිදු කරනු ලබන අතර එහි දී සියලු නිලධාරීන්ට අදාළවපුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳවඅධීක්ෂණය කරනු ලබයි. සෘජු කාර්යාල අධීක්ෂණය ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී හරහාද කොමසාරිස් හා සහකාර කොමසාරිස්(මෙහෙයුම්) මඟින් පළාත් ප්‍රජා විශෝධන කාර්යාල හා ප්‍රාදේශිය ප්‍රජා විශෝධන කාර්යාල ක්ෂණික පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආඥාලාභීන්ගේ අභිමු ක්ෂේත්‍ර අධීක්ෂණ සිදු කිරීම මඟින් ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වී ඇත්ද යන්න පිළබඳව හා නිලධාරීන්ගේ ප්‍රගතිය මැන බැලීම සිදු කරයි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023 වර්ෂයේ අගභාගය වන විට මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2022 වර්ෂයේ දී සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කර තිබුණි. මේ වන විට රා.ප.ව.02/2018(I) අනුව කටයුතු කරමින් පවතී.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරීන්, ප්‍රජා විශෝධන නිලධාරී සඳහා ගිවිසුම් යොමු කර ඇත. මේ වන විට රා.ප.ව.02/2018(I) අනුව කටයුතු කරමින් පවතී.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය.

සැලසුම් සහගත පුහුනු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි.	සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කර තිබුණ ද ප්‍රතිපාදන ගැටළු මත පුහුණු අවස්ථාවන් ලබා දීමට නොහැකි විය.
අයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂයට අදාලව මූල්‍යප්‍රකාශන පිළිබඳව තත්ත්වාණනය කළ මතයක් ලබා දී ඇත.
2020.08.28 දිනැති අංක02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	2023 වර්ෂයේ සිට කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධන දර්ශක 04ක් ඇතුළත් කර ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

.....

ලේකම්

අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

එම්.එන්. රණසිංහ
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.